# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.06 පැය 1350 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2176/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**2025.12.05 වන දින සවස 04.00 ට නිකුත් කරන ලද ඉදිරි පැය 36 ක කාලයක් සඳහා වන සාමාන්‍ය කාලගුණ අනාවැකිය සහ පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනය සම්බන්ධව.**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පූර්ව අනතුරු ඇගවීමේ නිවේදනයක් සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කාලගුණ අනාවැකිය සම්බන්ධ නිවේදනය නිකුත් කර ඇත. ඒ අනුව, දිවයින හරහා ඊසානදිග මෝසම් තත්ත්වය ක්‍රමයෙන් ස්ථාපිත වෙමින් පවතින බවට සඳහන් කර ඇත. තවද එම නිවේදනයේ පහත පරිදි සඳහන් කර ඇත.

- ❖ උතුර, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත් වලත්, මාතලේ දිස්ත්‍රික්කයේත් වැසි වාර කිහිපයක් ඇතිවිය හැක.
- ❖ බස්නාහිර සහ සබරගමුව පළාත් වලත්, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත් ස්ථාන කිහිපයක පස්වරු කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.
- ❖ බස්නාහිර, මධ්‍යම, සබරගමුව, ඌව, වයඹ සහ උතුරු මැද පළාත් වල ඇතැම් ස්ථාන වල අළුයම් කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් ඇති විය හැක.

එබැවින් ගිගුරුම් සහිත වැසි සමඟ ඇති විය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු විය හැකි අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසටත්, පවතින අවදානම් තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කර සිදුවිය හැකි ආපදා තත්ත්වයන් අවම කිරීමට, පාලනය කර ගැනීමට හා කළමණාකරනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසටත් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**